යම් කිසි ආබාධයක් සහිත පුද්ගලයෙකු සම්බන්ධ වන පුවතක් වාර්තා කිරීමේදී යොදාගත යුතු භාෂාව සම්බන්ධයෙන් ලෝකයේ පිළිගත් සම්මුතීන් වෙයි. එයින් එකක් වන්නේ, අදාළ ආබාධය පුවතට අදාළ වේ නම්, එම පුද්ගලයා "ආබාධිත පුද්ගලයෙකු (A disabled person)" ලෙසින් නොහඳුන්වා ඒ වෙනුවට එම පුද්ගලයා "ආබාධ සහිත පුද්ගලයෙකු (A person with a disability)" ලෙසින් හැඳින්වීමයි. මේ ඔස්සේ බලාපොරොත්තු වන්නේ වෙනස් කොට සැලකීම වැළැක්වීමයි. මෙය හැඳින්වෙන්නේ Person-first language නැතිනම් 'පුද්ගලයා පළමු වන භාෂාව' ලෙසයි. එනම් මෙහි අදහස වන්නේ ඒ පුද්ගලයා පළමුව පැමිණෙන බවත්, ඔහුගේ ආබාධ දෙවන තැන ගන්නා බවත් වේ.
මෙම ආබාධ සහිත වූවන් හැඳින්වීමට යොදාගන්නා වඩාත් යෝග්‍ය යෙදුම්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය ඔස්සේ යොදාගැනෙනා අවස්ථාවන් මෙන්ම, ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් නොවෙනා අවස්ථාවන්ද අපට දක්නට ලැබේ. ආබාධ සහිත වූවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මෙම වඩාත් යෝග්‍ය වූ යෙදුම් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
මූලාශ්‍ර:
https://adata.org/factsheet/ADANN-writing
https://ncdj.org/style-guide/
http://www.disability.wa.gov.au/Global/Publications/Understanding%20disability/words_that_work_media_guide.pdf
https://pwd.org.au/wp-content/uploads/2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf
#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima #Aruna
— with Lasanthi Daskon Attanayake.